DOI : 10.31357/fhssmst.2011.00698

# ළමා ලිංගික අපයෝජනය හා සමාජය

මාකාවිටගේ දිල්රුක්ෂි කුමාරි පෙරේරා

29 NOV 2011

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍රපති පරීක්ෂණය සඳහා

දර්ශනය විෂය යටතේ ඉදිරිපත් කරන නිබන්ධනයයි.

මේ අපේක්ෂකයා විසින් කරන ලද ප්‍රකාශය සත්‍ය බවත්, මේ නිබන්ධය ඇගැයීම් කාර්යය සඳහා විශ්වවිද්‍යාලයට ඉදිරිපත් කිරීමට සුදුසු බවට නිර්දේශ කරමි.

................................................ | 29/11/11

මහාචාර්ය ඥානදාස පෙරේරා මහතා | දිනය

උපදේශක

මෙ ශාස්ත්‍රීය නිබන්ධය මහාචාර්ය ඥානදාස පෙරේරා මහතාගේ සුපරීක්ෂණය යටතේ මා විසින් සම්පාදනය කරන ලද බවත්, මේ පර්යේෂණය කොටස් වශයෙන් හෝ සම්පූර්ණ වශයෙන් හෝ වෙනත් විශ්ව විද්‍යාලයකට හෝ ආයතනයකට හෝ වෙනත් උපාධියක් හෝ ඩිප්ලෝමාවක් සඳහා ද ඉදිරිපත් නොකරන ලද බවත් සහතික කරමි.

2011/11/29 .........  
දිනය

Dilrukshi Perera  
අපේක්ෂකයාගේ අත්සන

# ස්තූතිය

දියකුසෙහි පියවර මනින්නට

කියාදුන් මා පියාණන්ටත්

මහා මෙරක් සේ බර දරන්නට

මට පුරුදු කල මාගේ මෑණියන්ටත්

සෙනෙහසින් මා මුකුලිත කළ මිත්තණියටත්

සෙවනැල්ලක් බඳු මාගේ නැගනියන්ටත්

නිබන්ධනය සකස් කිරිමට උරදුන් සියළු දෙනාටත්,

මෙවන් කෘතියක් සම්පාදනය කිරිමට ධෛර්යය ශක්තිය ලබාදුන් ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ සියලු ගුරුවරුන්ටත්, නන් අයුරින් උදවු උපකාර කල සියලු දෙනාට මාගේ කෘතඥ පූර්වක ස්තූතිය පුද කරමි.

# පෙරවදන

මිනිසත්කම හා බැඳී තිබෙන අති ප්‍රබල තනි කේවල සාධකයක් වේනම් එය තම ආදරය, සෙනෙහසය, මෙය තමා උපන්දා සිට මියයනතුරාවටම තම ජීවිතය හා බැඳී පවතී.

නමුත් අද සමාජය ගත් කල මෙයද පුද්ගලයාගෙන් පුද්ගලයාට වෙනස් වන අතර, එනිසාම මෙය පුද්ගල සමාජයේ බහුතරයකගේ සැකයට තුඩු දෙන කරුණක් වී ඇත. එහි අතුරු ඵලයක් වශයෙන් අප ජීවත් වන සමාජයේ ද විවිධ වූ විෂමතාවන් පිළිලයක් මෙන් හට ගෙන ඇත.

එහෙයින් මෙම කරුණු පෙරදැරි කර ගෙන ළමා ලිංගික අපයෝජනය හා සමාජය සම්බන්ධව අළලා සැකසුණු මෙම ග්‍රන්ථය අද සමජයට බෙහෙවින් වැඩදායක වේ යැයි මා සිතමි.

වර්තමාන සමාජය වු කලී වාණිජමය හා ආත්මාර්ථය වශයෙන් අනිසි ලෙස ළමයින් ලිංගික කටුයතු ලෙස යොදා ගැනීම බහුලවම දකින්නට ඇති ප්‍රබල සාධකයක් වේ. පසුගිය දශකයන් දෙස නැවත හැරී බැලීමක් සිදු කල විට මෙවැනි වූ නිදසුන් අප සමාජයේ බොහෝ පැහැදිලිව දක්නට ඇත.

මේ සම්බන්ධව අද සමාජය දැනුවත් කිරීම හා හැකි ප්‍රමාණයෙන් මෙවැනි සිදුවීම් වලක්වා ගැනීම අරමුණු කොට ගෙන මාගේ හැකි ශක්ති ප්‍රමාණයෙන් මෙම ග්‍රන්ථය සම්පාදනය කළෙමි.

මෙම කෘතිය සම්පාදනය කිරීමට මෙය ඉදිරිපත් කිරීමටත් එමෙන්ම උපදේශකත්වය ලබාදුන් ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ මහාචාර්ය ඥානදාස පෙරේරා මහතාට මාගේ ස්තූතිය පුද කරමි.

# පටුන


පිටු අංකය

**01.** **හැඳින්වීම.** 1-5

**පළමු පරිච්ඡේදය**

2.1 ළමා ලිංගික අපයෝජනය හා එහි ප්‍රභේද 6-24

2.2 ළමා ලිංගික අපයෝජනයෙහි ඉතිහාසය හා විකාශය 24-33

**දෙවන පරිච්ඡේදය**

03. ළමා ලිංගික අපයෝජනය විකාශණය විමට හේතු සාධකයන් 34-69

**තුන්වන පරිච්ඡේදය**

04. ළමා ලිංගික අපයෝජනයේන සමාජයට වන හානිය හා එහි ප්‍රතිවිපාක 70-100

**හතරවන පරිච්ඡේදය**

05. ළමා ලිංගික අපයෝජන සම්බන්ධයෙන් ලංකාව තුල තිබෙන නෛතික තත්ත්වය 101-130

**පස්වන පරිච්ඡේදය**

06. ළමා ලිංගික අපයෝජනය ශ්‍රී ලංකාවෙන් තුරන් කිරීමට ගත යුතු පියවර 131-162

**හයවන පරිච්ඡේදය**

07. ළමා ලිංගික අපයෝජන ශ්‍රී ලංකාවෙන් තුරන් වීමෙන්පසු ලංකා සමාජයට එය කෙසේ බලපානවාද? 163-173

නිගමනය 174-176

# හැඳින්වීම.

ආර්ථිකය සහ සමාජය මත ඉමහත් බරක් පැටවෙන ප්‍රධාන පෙලේ සමාජ සහ සෞඛ්‍ය ගැටළුවක් ලෙස ළමා අපයෝජනය හඳුනාගෙන ඇත. නමුත් මෙය දකුණු ආසියාව ඇතුළු සංවර්ධනය වෙමින් පවත්නා රටවල් විසින් මෙතෙක් හඳුනාගෙන නොමැත. ළමයා යනු අනාගත පරම්පරාවය. ඔවුන් රැක බලා ගැනීම පවතින නීතියෙන්, සමාජයේත් වගකීම වේ. ළමයෙකු හැඳින්වීමේ දී නීතිමය වශයෙන් හා ජීව විද්‍යාත්මක වශයෙන් සහ සමාජ විද්‍යාත්මක වශයෙන් මොවුන් නිර්වචනය කල හැකිය.

සමාන්‍ය නීතියට අනුව ළමයෙකු යන්නෙන් අදහස් වන්නේ වයස අවුරුදු 18 අඩු මනුෂ්‍යයන්ය ජීව විද්‍යාත්මකව හැඳින්වෙන්නේ සාමජයේ සිටින මනස නොමේරු මනුෂ්‍ය කොට්ඨාශය ළමයා යනුවෙනි. සමාජ විද්‍යානුකූලව ළමයා යන්නෙන් විවිධ අර්ථ නිරූපනයන් කෙරේ. සමස්තයක් ලෙස ගත් කල සමාජ විද්‍යානුකූලව ළමයා යන්නෙන් අදහස් කල හැක්කේ කෙනෙකු යටතේ පාලනය වන ස්වයං තීරණ ගත නොහැකි පුද්ගලයන්ය. මේ නිසාම ළමයා විවිධ අයගේ හිංසනයන්ට ලක්වේ.

ළමා අපයෝජනය යනු ළමයෙකුගේ කායික හා මානසික තත්ත්වයන්ට බලපෑමක් වනසේ කිසියම් තැනැත්තෙකු ළමයෙකු වැරදි ක්‍රියාවල යොදවා ගැනීමය. ළමයෙකුට සිදුවන ළමා අපයෝජන ප්‍රභේද කීපයක් හඳුනාගෙන ඇත.

01. කායික

02. මානසික

03. ලිංගික

කායික
- පෝෂණය නොසලකා හැරීම.
- පහරදීම හා පිලිස්සීම.
- සෞඛ්‍ය ලබා නොදීම.

මානසික
- විවේචනය කිරීම.
- තර්ජනය කිරීම.
- සමච්චලයට ලක් කිරීම.
- බැන වැදීම.

ලිංගික
- ස්පර්ශ කිරීම.
- ස්පර්ශ කරවා ගැනීම.
- සමලිංගික සේවනයේ යෙදවීම.
- දූෂණය

මේ අතරිත් වර්තමානයේ ප්‍රචලිතව පවතින්නේ ළමා ලිංගික අපයෝජනයයි. ලිංගික අපයෝජනය පැහැදිලි කිරීම සඳහා තවත් ආකාර කිහිපයකට බෙදා දැක්විය හැකිය.

01. කායික.

02. කායික නොවන යනුවෙනි.

ළමයෙකු විසින් සම්පූර්ණයෙන්ම අවබෝධ කර නොගන්නා ලද හෝ කරුණු දැනගෙන කැමැත්ත දීමට නොහැකි වන හෝ සංවර්ධනාත්මක වශයෙන් ළමයෙකු සූදානම් වී නොමැති හෝ සමාජයේ සමාජ තහංචි වන්නා වූ ලිංගික ක්‍රියාවලියකට ළමයින් හසුකර ගැනීම ළමා ලිංගික අපයෝජනයයි. වයස හෝ සංවර්ධනය වීම හේතුවම වගකීමක් විශ්වාසයක් බලයක් යටතේ සිටින්නාවූ ළමයෙකු හෝ වැඩිහිටියෙකු හෝ වෙනත් ළමයෙකු අතර සිදු වන්නාවූ ක්‍රියාකාරකමකින් ළමා ලිංගික අපයෝජනය දැක්වෙන අතර, මෙම ක්‍රියාකාරකමෙන් අපේක්ෂා කරනුයේ අනෙක් තැනැත්තා පිනවීම හෝ ඔහුගේ අවශ්‍යතාවය ඉටු කර තෘප්තිමත් කිරීමය.

ළමයා ලිංගික අපයෝජනයේදී වැඩිහිටියෙකු වන අනික් පුද්ගලයාගේ බලසම්පන්නකම මගින් ළමයාගේ බෙහීනකම අයුතු ලෙස තමන්ගේ ප්‍රයෝජනයට යොදවා

ගනු ලැබේ. ළමා ලිංගික අපයෝජනය පිළිබඳව කරනු විස්තරාත්මක පැහැදිලි කරමින් සාකච්ඡා කිරීම නිසි විටෙකත් ප්‍රසන්න වන සිත් ගන්නා සුළු කටයුත්තක් නොවේ. එය එසේ වුවද අපගේ දරුවන් ගොදුරු වියහැකි අනතුරු කවරාකාර වේ දැයි අප විසින් දැන සිටීම අතිශයින් වැදගත් බැව් සඳහන් කල යුතුය.

ඒ අනුව ලිංගික අපයෝජනය, අපයෝජනයට ලක්වන ළමයාට පමණක් නොව සමාජ විවිධ ස්ථරයන් වලටත් මුළු මහත් සමාජයටත් එකසේ මහත් බලපෑමක් වන බව ප්‍රත්‍යක්ෂ වේ.

## අධ්‍යනයේ අරමුණු

01. ළමයින් ලිංගික අපයෝජනයට ලක්වීමට බලපාන හේතු වන කරුණු පෙන්වාදීම (ආර්ථිකය, සංස්කෘතිය, සංචාරක කර්මාන්තය,සමාජ මට්ටම් හා දුරිද්‍රතාවය සම්බන්ධව විවිධ වු කරුණු වෙන වෙනම ගෙන සාකච්චා කිරිම)

02. එසේම ඒ තුලින් සාමජයට වන හානි පෙන්වා දීම. රටේ ආරම්භය හා අනාගතය වන ළමයාගේ අධ්‍යාපන මට්ටම පහල වැටිම, ඒ තුලින් උගත් බුද්ධිමත් පිරිසක් නොමැති වීමෙන් රටේ සංවර්ධනවය සමාජයේ දායකත්වයක් නොමැතිවේ. මේ තුලින් රටට අහිතකර පුද්ගලයන් බිහිවීම තුලින් රටේ පවතින නීතීය හා සාමයට බාධාවක් ඇතිවීම.

03. මෙම ළමා ලිංගික අපයෝජන ක්‍රියාවන් දිනෙන් දින වැඩිවීමට හේතු වන කරුණු පෙන්වාදීම හා එය වලක්වා ගැනීමට ගත යුතු පියවර පෙන්වාදීම.

04. මේ සම්බන්ධයෙන් වැඩිහිටි හා ළමා පරපුර දැනුවත් කිරිම හා මෙම අපයෝජන සිදුවීම් සමාජයට විවෘත කිරිම. එසේම සමාජයේ ඇති දුර්මතයන් තුරන් කිරිමට ගත හැකි ක්‍රියා මාර්ග පෙන්වාදීම.

05. මෙවැනි ක්‍රියාවල යෙදෙන අය නීතියේ රැහැනට හසුකර ගැනීමේ වැඩ පිළිවෙලක් පෙන්වාදීම. (ළමයාට මෙවැනි ලිංගික ක්‍රියාකාරකම් සම්බන්ධව දැනුවත් කර එම ළමයා අපයෝජනයට ලක්කර ගැනීමට තැත් කරන පුදලයින් ළමයින් තුලින්ම එම අවස්ථාවේදීම නීතියේ රැහැනට හසුකර ගැනීම.

06. රටේ ආරම්භය හා අනාගතය වන ශ්‍රී ලාංකීක ළමා පුරපුර ලිංගික අපයෝජනය තුලින් එය අවම කර සුන්දර ලංකීය සාමජයක් ගොඩනැංවීමට අවශ්‍ය වන පසුබිමක් මේ තුලින් සකස් කිරිම මෙම විෂ ක්ෂේත්‍රය පර්යේෂණ කිරිමෙන් හා එම පර්යේෂණයන් තුලින් ළමා පුරපුරට සිදුවන හානි වලක්වා ගැනීමට ක්‍රම උපායන් සොයාගත හැක.

# ක්‍රම වේදය

## අධ්‍යයන ක්‍රම වේදය

| මූලාශ්‍ර අධ්‍යයනය | සම්මුඛ සාකච්ඡා ක්‍රමය |
| --- | --- |
| 01. ප්‍රාථමික මූලාශ්‍ර ක්‍රමය | 01.ඒක පුද්ගල සාකච්ඡා |
| 02. ද්විතීක මූලාශ්‍ර | 02. සමූහ සාකච්ඡා ක්‍රමය. |

## මෙම පරීක්ෂණය සිදු කිරීම සඳහා භාවිතා කරන ක්‍රමවේදයන්

01. මුලාශ්‍ර අධ්‍යයනය (Study of Sources)

02. ක්ෂේත්‍ර අධ්‍යයනය (Study of Fields)

03. ප්‍රත්‍යායක අධ්‍යයනය (Case Studies)

04. සම්මුඛ සාකච්ඡා ක්‍රමය (Interview Methods)

මෙ නිබන්ධනය ඉදිරිපත් කිරීමේදී ඉහත සඳහන් ආකාරයට ක්‍රම වේදයන් අනුගමනය කිරීමෙන් ඉදිරිපත් කිරීම කරනු ලබයි.

# පලමු වැනි පරිච්ඡේදය

## ළමා ලිංගික අපයෝජනය හා ප්‍රභේද

ආර්ථිකය හා සමාජය මත ඉමහත් බරක් පැටවෙන ප්‍රධාන පෙළේ සමාජ සහ සෞඛ්‍ය ගැටළුවක් වශයෙන් ළමා අපයෝජනය දකුණු ආසියාව ඇතැම් සංවර්ධනය වෙමින් පවත්නා රටවල් වල මෙය ඉමහත් ගැටළුවක් බවට පත්වී ඇත. ලොව පුරා සිටින උපතේ සිට වයස අවුරුදු 14 දක්වා වු ළමයින් මිලියන 40 ක් පමණ අපයෝජනයට සහ නොසලකා හරිනු ලැබිමට භාජනය වී ඇතිබව මෑතකදී කරන ලද සොයා බැලීමකදී හෙලිවී ඇත. (ලෝක සෞඛ්‍ය සංවිධානය 99) සෑම තත්පරයකදීම ලොව කොහේ හෝ කෙනෙක් ළමා ලිංගික අපයෝජනයට ලක්වේ. අයිතිවාසිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනයේත් දණ්ඩ නීති සංග්‍රහයන් තුලින් දඩුවම් පිළිබඳ අර්ථ දක්වා තිබුණද 80 දශකය වන තෙක් මාතෘකාවන් වශයෙන් යටපත් වී තිබුණි. ළමා අයිතිවාසිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය මගින් 1989 න් පසු ලෝකයේ බොහෝ රටවල අපයෝජන සිද්ධින් වාර්තා වීම ඉහල අගයක් ගන්නා ලදි.

ශ්‍රී ලංකාවේද 1995 ළමා ප්‍රඥප්තියට අත්සන් තැබිමත් සමඟම සමාජයේ කථා බහ කල යුතු වැදගත් මාතෘකාවක් බවට මෙය පත්විය. එබැවින් වර්තමානය වන විට ළමා අපයෝජනය සම්බන්ධ සිදුවීම් වාර්තා වීමට පටන් ගෙන ඇත. පාවෙන හිම කඳු සන්සිද්ධියක් බඳු අපයෝජනය මාතෘකාව විවිධ ආයතන වල දැනුවත් කිරීම තුලින් නීතියේ රැහැනට හසුවන ප්‍රමාණය වැඩි විය.මුල් කාලයේදී ලිංගිකව අපයෝජනය සිදු වන්නේ සංචාරක ව්‍යාපාරයත් සමඟ මුහුදු බඩ ප්‍රදේශ වල වාසය කරන ළමුන් බව පිලිගත් නමුත් වර්තමානය වන විට එය වෙනස්වී දේශීය අපයෝජකයන්ද සිටින බවට වාර්තා විය. ඒ අතර ළමයාට ඉතාම සමිපව ලඟම ඥාතින් ගුරුවරුන් නිසා අපයෝජනය වන බව තොරතුරු විමර්ශනයේදී පැහැදිලි විය.

ළමයා තවත් කෙනෙක් මත යැපෙන දෙමාපියන්ගේ වස්තුවක් ලෙසට සැලකීමත් ඔවුන්ට හැම විටම වැඩිහිටියන්ගේ බසට අවනත විය යුතු බවත් සමාජය පිලිගැනීම විය. වැඩිහිටියන් කුමක් කලත් ඔවුන්ට ගෞරව කිරීමක් වශයෙන් නිහඩව සිටිම දකුණු ආසියාතික සංස්කෘතියේ අංගයක් බවට පත්වී තිබේ. සාරධර්ම හා සංස්කෘතිකාංග වලට දක්වන දැඩි පක්ෂපාතිත්වය නිසා වැඩිහිටියන් තුලින් දරුවන් නොමනා හැසිරීම් සිදුවන බවට පිලිගැනිමටවත් මුල් කාලයේ සමාජය කැමැති වුයේ නැත. ඥාතින්ම වැඩිහිටියන්ට මෙන්ම ගුරුවරුන්ට වුන් කියන දේ ඇසිමෙන් ඔවුන් කියන දෙයක් ඉටු කිරීමටත් සමාජය සකස් වී තිබුණි. එවැනි පරිසරයක් තුල දරුවන් නොමනා ක්‍රියාවලිට පොළඹවා ගැනීම හා යොමු කරවා ගැනීමට ඇති ඉඩකඩ පුළුල් විය. දෙමාපියන් එවැනි දේවල් සිදු වු විට විශ්වාස නොකිරීමත් නිසා දරුවන්ද මුල් කාලයේදී මෙය රහසක් වශයෙන් තබා ගන්නා ලදි. දරුවන් අතපත ගෑම අනිසි ලෙස සිප ගැනීම වැරැද්දක් වශයෙන්වත් සිතුවේ නැත. එය දරුවාට ඇති සැබෑ ආදරය නිසා සිදුවන බව විශ්වාස කරන්නට විය.

**දරුවන් අපයෝජනයට ලක්වීමට හේතු වශයෙන්**

බිඳුණු පවුල් පරිසරය පැවතීම

පියා දැඩි ලෙස මත් පැන් වලට යොමු වීමත් මව මැද පෙරදිග යාමත් නිසා බොහෝ දරුවන් ලිංගිකව අපයෝජනය වේ.

ඊට අමතරව අනියම් සම්බන්ධතාවයන් දෙමාපියන් ගොඩනගා ගැනීම තුලින් සුළු පියා අතින්ද අපයෝජනයන් සිදුවේ. විස්තෘත පවුල එක්තරා පැත්තකින් දරුවා ආරක්ෂා කරන අතර තවත් පැත්තකින් අපයෝජනය වු විට සමාජ අපහාසය තිත වසා දමන්නට උත්සහ ගනි. මාමා,සීයා හෝ බාප්පා අතින් අපයෝජනයට ලක් වු විට එයින් පවුලට හා දරුවාට සිදුවන ලැජ්ජාව නිසා යටපත් වීම නිසා එක්තරා ආකාරයට පවුල් ක්‍රමය තුල දරුවා අපයෝජනයට ලක් කරවීමට හේතුවක් වී ඇත.

අනෙක් අතට පාසලේ ගුරුවරුන්ට දක්වන දැඩි සැලකිල්ල හා ගෞරවය නිසාද මෙවැනි සිදුවීම් යටපත් විය. ගුරුවරයා සැම විටම දරුවාගේ යහපත සඳහා කටයුතු කරන බව සමාජය විශ්වාස කරනු ලැබිය. එබැවින් දරුවන්ද ඔවුන්ට ගෞරවය හා විශ්වාසය කරන්නට විය. එයද ළමයාට අහිතකර ආකාරයට බලපාන බව වත්මන් සමාජය දෙස බලන විට උදාහරණ ඕනෑ තරම් පවති.

පවුල තුලින් දරුවාට ලිංගික අධ්‍යාපනයක් ලබා නොදීම ප්‍රධාන වශයෙන් දරුවන් ලිංගික අපයෝජනයට ලක් වීමට හේතුවකි. දරුවන් ක්‍රමයෙන් වර්ධනය වනවිට තම ශරීරය පිළිබඳ වුවද මනා අවබෝධයක් ලබා ගන්නේ සම වයස් කණ්ඩායම් තුලින් හෝ කාමය අවුස්සන පුවත් පත් තුලිනි. ඒවා ප්‍රකාශ කර ඇති ආකාරය දරුවන්ට නිසි අවබෝධයක් ලැබෙන අයුරින් නොවේ.

එම නිසා කුතුහලය දරුවන්ගේ ඇති වන්නේ මේ හේතුවෙන් අපයෝජකයන්ගේ ගොදුරු බවට පත්වීමට ඉඩකඩ තවත් පුළුල් කරදේ. ජනමාධ්‍ය ගත්විට දරුවන් වක්‍රාකාරයෙන් ලිංගික භාණ්ඩයක් බවට පත් කර ගනි. රූපවාහිණියෙන් විකාශනය වන ඇතැම් කාටූන් වැඩ සටහන් තුලින් මේ බව මනාව ඔප්පු වේ. ඊට අමතරව වෙළඳ දැන්වීම් සඳහා දරුවන් අඩ නිරුවතින් ප්‍රදර්ශනය කිරිම ඒ සඳහා පොලඹවා ගැනීමද සිදුවේ. එවැනි තත්ත්වයක් උඩ දරුවන් ලිංගික අපයෝජනයට යොමුවීමට ඇති ඉඩ කඩ පුළුල්වේ.

ඉහත සඳහන් හේතු සාධකයන්ද පදනම් කර ගනිමින් ළමා ලිංගික අපයෝජන සම්බන්ධ සවිස්තරව විමර්ශනය පහත සඳහන් පරිච්ඡේද වලින් පෙන්වා දීමට බලාපොරොත්තු වේ. ළමයා යන්න අවබෝධ කර ගැනීමත් ලිංගික අපයෝජනය ඇතැම් අපයෝජන වර්ගයන් අර්ථ දැන්වීමක් ශ්‍රී ලංකාවේ ලිංගික අපයෝජනය වැලැක්වීමට ඇති නෛතික රාමුව විමර්ශනය කිරීමත් මෙගින් සිදු කල යුතුවේ.

ශ්‍රී ලංකාවේ නීතිය යටතේ ළමයකු යන්නෙන් අර්ථ නංවන්නේ කුමන වයස් මට්ටමකට අයත් පුද්ගලයකුද යන්න පිළිබඳ ව්‍යාකුල තත්වයන් පවති. එයට හේතුව වන්නේ ශ්‍රී

ලංකාවේ ව්‍යවස්ථාපිත නීති වල විවිධ වූ වයස් මට්ටම් ඒ ඒ නීති ප්‍රතිපාදනයක් අර්ථ දැක්වීමේදී ළමයාගේ වයස ලෙස සඳහන්ව තිබීමයි. එම නිසා ළමයෙකුට එරෙහිව සිදු කරන ලද වරදක් සම්බන්ධයෙන් කටයුතු කරන විටදී එම ප්‍රශ්න වැරදි නිර්වද්‍ය කරන නීතියක් ළමයෙකුගේ වයස් මට්ටම කුමන ආකාරයෙන් දක්වා ඇත්තේද යන්න පිළිබඳ විමසිලිමත් විය යුතුව ඇත.

දණ්ඩ නීති සංග්‍රහයේ 75 වන වගන්තියට අනුව වයස අවුරුදු 8 ට අඩු පුද්ගලයකු කරන කිසිම ක්‍රියාවක් නීතිය අනුව වරදක් වශයෙන් නොසැලකේ. ළමා හා යෞවන ආඥා පනතට අනුව ළමයා යන්න ''වයස අවුරුදු 14 ට අඩු පුද්ගලයකු වන අතර ගැටවරයා යන්න වයස අවුරුදු 14 - 16 අතර පුද්ගලයින් ලෙස සැලකේ. '' මීට අමතරව ළමයා යන්න වයස අවුරුදු 18 ට අඩු පුද්ගලයන් ලෙස ජාත්‍යන්තර ළමා අයිතිවාසිකම් ප්‍රඥාප්තියේ 1995 අංක 22 දරණ දණ්ඩ නීති සංග්‍රහයේ සංශෝධන පනත (286 ඇ) සහ 1998 අංක 29 දරණ දණ්ඩ නීති සංග්‍රහයේ සංශෝධන පනතේ 288 (ආ) 2 උප වගන්ති වලින් පෙන්වා දී ඇත.

ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තියේ ළමයා යන්න වයස අවුරුදු 18 ට අඩු සෑම තැනැත්තෙකුම යන්න'' අදහස් වේ. ළමයා යන්න නිශ්චිත නිර්වචනයක් නැතිවා වගේම ළමා අපයෝජකයා සම්බන්ධයෙන්ද එක් නිර්වචනයක් ඉදිරිපත් කල නොහැකිය.ලෝක සෞඛ්‍ය සංවිධාන වාර්තාව 1999 පෙන්වා දෙන ආකාරයට සියලු ආකාරයේ කායික හෝ චිත්තවේග පීඩාවක් ලිංගික අපයෝජනයන් නොසැලකිල්ලෙන් හෝ වාණිජ අනවධානාත්මක සැලකිල්ලක් හෝ ළමයාගේ සෞඛ්‍යමය පැවැත්මට සංවර්ධනයට හෝ ගරුත්වයට වගකීම විශ්වාසය හෝ බලය පිළිබඳ සන්දර්භය තුලදී විභව පීඩාව ප්‍රතිඵල වශයෙන් ලබා දෙන්නාවූ අයුතු ප්‍රයෝජන ළමා අපයෝජනයට හෝ ළමා හිංසනයට අඩංගු වේ.